රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 08/2024

මගේ අංකය : F/FR/03/GBR/Circular
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2024.06.05

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

## රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2024.06.30

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක: 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛයට (මෙය https://www.treasury.gov.lk/api/file/9b53869c-39ec-48b9-a16b-609a0e01a9e5 මඟින් බාගත කළහැකිය ) හා එහි සංශෝධන වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක 20.02.01.01 වන “රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී” ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්/ ගණන්දීමේ නිලධාරින් විසින් මු.රෙ.128 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව එකී ආදායම් සංකේතාංකයට අදාළව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

03. එබැවින් 20.02.01.01. වන “රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී” ආදායම් සංකේතාංකය යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධ ගිණුම් පොත් නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 පරිදි අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01ට අනුකූලව 2024.06.30 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා 2024.07.15 දිනට පෙර “buildingrentpubad@gmail.com” යන විද්‍යුත් තැපැල් ලිපිනයට මෘදු පිටපතක් ද සහිතව මෙම අමාත්‍යාංශයෙහි "ප්‍රධාන මූල්‍ය නිලධාරී" වෙත ඉදිරිපත් කලයුතු අතර අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද, එක් එක් වර්ෂයට අදාළ හිඟ ආදායමට අනුරූපීව 2024 වර්ෂයේ මුල් මාස හය තුල රැස්කරන ලද මුදල් පිළිබඳ විස්තර ද ඊට අමතරව එම කාලච්ඡේදය තුළදී මු.රෙ.113 ට අනුකූලව භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද හිඟ ආදායම් වේ නම් ඒ සම්බන්ධ විස්තර ද අමුණා ඇති ආකෘති පත්‍ර 02 ට අනුකූලව ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන අංකය :- 0112-056580
ෆැක්ස් අංකය :- 0112- 695723
විද්‍යුත් ලිපිනය:- fin.report.pubad@gmail.com

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

# 2024.06.30 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. ව්‍යවස්ථාව /අධිකාරිය - ආයතන සංග්‍රහය / ඉඩම් සංවර්ධන ආඥා පනත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 08/2024

II. ව්‍යවස්ථාපිත අධිකාරිය - රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

III. ආදායම් අයිතමය - රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී

IV. ආදායම් සංකේතාංකය - 20.02.01.01.

| විස්තරය (රජයේ ගොඩනැගිලි කුලී ආදායම් වර්ගීකරණය) (1) | හිඟ ආදායම් | | | | | හිඟ සඳහා හේතු * (7) | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග * (8) | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය * (9) |
|---|---|---|---|---|---|---|---|---|
| | 2021.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු. (2) | 2022 වසරට අදාල හිඟ මුදල රු. (3) | 2023 වසරට අදාල හිඟ මුදල රු. (4) | 2024.01.01 සිට 2024.06.30 දින දක්වා හිඟ මුදල රු. (5) | 2024.06.30 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු. (6) | | | |
| i. නිල නිවාස | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි/ | | | | | | | | |
| iv. ගබඩා | | | | | | | | |
| v. වෙනත්(ආපනශාලා,ශ්‍රවණාගාර, කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි ) | | | | | | | | |
| එකතුව | | | | | | | | |

2023.12.31 දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක 2 සිට 4 දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් 2024 වර්ෂයේ මුල් මාස හය දක්වා අයවිම් ඇතොත් ඒවා අඩු කළ පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම සුදුසු වේ.

* 7, 8 සහ 9 තීරු සඳහා වලංගු පැහැදිලි හේතුන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. ඒ සඳහා ආකෘතියේ ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීම සුදුසුවේ.

සැ.යු. :- හිඟ ආදායම් දැක්වීමේදී ඉහත වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වන්න.

දිනය - …………………………..

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

……………………………………………

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)

# 2024.06.30 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :

ආදායම් සංකේතාංක : **20.02.01.01.**

| විස්තරය | 2024 මුල් මාස 06 තුල හිඟ ආදායම් එකතු කිරීම | | | | * 2024 මුල් මාස 06 තුල හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2021.12.31 දක්වා | | 2022 | | 2023 | | |
| | 2021.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් රු. | 2022 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම රු. | 2023 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම රු. | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) රු. | හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු. | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු. | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් රු. | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) රු. |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| i. නිළ නිවාස | | | | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි | | | | | | | | | | | |
| iv. ගබඩා | | | | | | | | | | | |
| iv. වෙනත් (ආපනශාලා,ශ්‍රවණාගාර, කුලියට හෝ බද්දට දී ආදායම් ලබන වෙනත් ගොඩනැගිලි ) | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

* මෙම ආදායම් සංකේතාංකය යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කළ යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

දිනය :- ............................

.......................................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)